# ලංකාණ්ඩුවේ "ගැසට්" පත්‍රය.

ආණ්ඩුවේ අවසරයපිට ප්‍රසිද්ධකරණලදී.

අංක. 8,925—1942ක්වූ මැයි මස 1 වෙනි දිනවූ සිකුරාදා.


## Part IV.—හතරවෙනි කාණ්ඩය.

### ආණ්ඩුවේ ඉඩම් විකිණීම හෝ බදුදීම සඳහා දැන්වීම.

No. 13,749, S. O.—ඉඩම් නිරවුල්කිරීමේ නිලධාරීතුමා විසින් මෙහි පහත සඳහන්වෙන ආණ්ඩුව සන්තක ඉඩම් ආණ්ඩුවේ නියෝගවල ප්‍රකාරයට වර්ෂ 1942ක්වූ ජූනි මස 17වෙනි දිනවූ බදාදා පෙරවරු 9.30ට කුරුවිට ගම්සභා උසාවියේදී ගම්සද්දේසිකර විකුණන්ට හෝ බේරුම්කරදෙන්ට නොහොත් වෙන අයුරකින් තීන්දුකරන්ට යෙදෙනවා ඇත. සබරගමු දිසාවේ රත්නපුර දිස්ත්‍රික්කයේ කුරුවිටිකෝරළේ පිහිටා තිබෙන බිම්කැබලි 8ක්.

ලංකාමැනීමේ මුල් සිතියමේ නො. 384. ගම—අතුරලිය.

| නො. | ඉඩමේ නම. | ඉල්ලුම්කාරයා හෝ අයිතිකම්කියන්නා. | අන්දම. | මනත, අ. රූ. ප. | | |
|---|---|---|---|---|---|---|
| 10 | මාවුස්සාගොඩමූකලාන | උඩුතුලාගෙ පදිංචි (1) කිල්වලකන්කානිගේ ගුනරත්හාමි, (2) එම එම පොඩිඅප්පුහාමි, (3) එම එම පොඩිමැනිකේ, (4) එම එම ජයවතීන, (5) එම එම රම්මැනිකේ, (6) එම එම මුදියන්සේ, (7) එම එම සිංඤිසිමහත්මියා | මූකලාන | 1 | 2 | 4 |
| 19B | බෙරවාපැල්පොලවත්ත | මැදගම පදිංචි කන්කානිගේ සිරිවඩ්නහාමි | රබර් | 0 | 2 | 38 |
| 58 | පන්දෙනියෙහේන | පාහඳුරේ පදිංචි (1) සිසිල් අර්නෙස්ට් ගුනරත්න, (2) මර්සි මියුරියල් විරසිංහ | එම | 7 | 2 | 13 |
| 60 | හැඹුහාහේමක්ත | එම | එම | 37 | 0 | 33 |
| 65 | කොළඹියාගේ දෙනියේ හේන්යාය, කොළඹියාගේදෙනියේවත්ත | එම | එම | 13 | 0 | 4 |
| 67 | පන්දෙනියේ හේන සහ කිනිහිරිකුඹුරේ හේන | එම | එම | 1 | 3 | 36 |
| 70 | හැඹුහාහේමක්ත | එම | එම | 1 | 3 | 1 |
| 73 | කපුගේවත්තෙහේනේන | ගනිතගේ නාන්දෙරිසා | එම | 0 | 2 | 18 |

තක්සේරු මිල අක්කරයක් රුපියල් 100කට වැඩිනොවන මුදලක් වේ.

මෙකී ඉඩම් ගැන වැඩිදුර තොරතුරු කොළඹ ඉඩම් බේරුම්කරන නිලධාරීතුමාගෙන්ද, ඒවායේ සිතියම් කොළඹ සර්වෙයර් ජනරල් උන්නාන්සේගෙන්ද ලබාගත හැකිවේ.

වර්ෂ 1942ක්වූ අප්‍රේල් මස 25වෙනි දින කොළඹ ඉඩම් පිළිබඳ කොමසාරිස් උන්නාන්සේගේ කන්තෝරුවේදීය.

එම්. ඊ. ජෑන්ස්,
ඉඩම් පිළිබඳ කොමසාරිස් උන්නාන්සේ වෙනුවට.

---

### ආණ්ඩුවට ඉඩම් ලබාගැනීම සම්බන්ධ දැන්වීම.

ආණ්ඩුවේ කටයුත්තකට එනම්:—කොළඹ-මහනුවර ප්‍රසිද්ධ පාර කැලණිය අසලදී රේල්පාරට සම්බන්ධකර පාරක් සෑදීම පිණිස මෙහි පහත සඳහන්වෙන ඉඩම් ලබාගැනීම සඳහා ක්‍රියාකරණ පිණිස "ආණ්ඩුවට ඉඩම් ලබාගැනීමේ ව්‍යවස්ථාවේ" 5වෙනි වගන්තියේ කරතිබෙන පංගාර්තුවල ප්‍රකාරයට පලාත් ආණ්ඩු කාරක මහතුණ් සභාවට උතුමාණන්වහන්සේගෙන් පැවරී තිබෙන බලයෙන් නියමාකාර මට අණ ලැබී තිබේ, ඒ ඉඩම් නම්:—

සිතියමේ නො. A 1,456. ගම—පැලියගොඩ පට්ටිය.

| නො. | ඉඩමේ නම. | අන්දම. | අයිතිකම්කියන්නා. | මනත, අ. රූ. ප. | | |
|---|---|---|---|---|---|---|
| 1 | කොස්ගහවත්ත | කෙසෙල් පඳුරු 9ක් සහ පස්කන්ඩියක් කොටසක්ද ඇති පොල්ඉඩම | ඇස්. සී. සිල්වා, බඩුවත්ත, කටාන | 0 | 0 | 5·8 |
| 3 | එම | කෙසෙල් පඳුරක් ඇති පොල්ඉඩම | එම | 0 | 0 | 0·4 |

එබැවින් ඉඩම් අයිතිකරගැනීමට ආණ්ඩුවේ කල්පනාව තිබෙන බව පොදුජනයාට දැනගැන්ම සඳහා හයවෙනි වගන්තියේ නියමකර තිබෙන හැටියට මෙසින් දැනුම්දෙමි.

ඉහතකී ඉඩම්වලට අයිතිවාසිකම් ඇත්තාවූ සෑමදෙනාම තමුන්ම නොහොත් තමුන් වෙනුවට ක්‍රියාකරන අය වර්ෂ 1942ක්වූ මැයි මස 25වෙනි දින පෙරවරු 10ට මෙම කච්චේරියේදී මා ඉදිරිපිටට පැමිණ ඒ කොයි අයුරෙන් අයිතිවාසිකම්ද කියා කියාසිටින්ට ඕනෑවා සහ මෙම ඉඩම් වෙනුවට ඉල්ලාසිටින මුදල් ගණනක් ඒවා ඇත්තාවූ තමුන්ගේ අයිතිකමේ තොරතුරුත් කියාසිටින්ම ඕනෑ බව මෙසින් දැනගත යුතුයි.

වර්ෂ 1942ක්වූ අප්‍රේල් මස 27වෙනි දින කොළඹ කච්චේරියේදීය.

ජේ. ඇල්. ඊ. ප්‍රනාන්දු,
ආණ්ඩුවේ අතිරේක උප ඒජන්ත වෙනුවට.

---

### රජසන්තක රබර් ඉඩම් බදුදීම.

LW 5265

සබරගමු පලාතේ රත්නපුර දිස්ත්‍රික්කයේ පිහිටි මෙහි පහත සඳහන් රජසන්තක රබර් ඉඩම්වල 1943දෙසැම්බර් මස 31වෙනි දින දක්වා කිරිකපා ප්‍රයෝජනගැනීමේ බලය ඉල්ලා එවන්ට යෙදෙන ඉල්ලුම්පත්‍ර සබරගමු පලාතේ ආණ්ඩුවේ ඒජන්ත උන්නාන්සේ විසින් බාරගනු ලැබේ. මෙම ඉඩම් ආණ්ඩුව විසින් රිජිස්ටර්කර තිබේ.

2. "Tenders for the right to take the produce of rubber trees" එනම් "රබර් ගස්වල කිරිකපා ප්‍රයෝජන ගැනීමට බලය ඉල්ලුම්කරන ඉල්ලුම්පත්‍රය" යන වචන ඇන්විලෝප් එකේ මතුපිට ලියනලද මුද්‍රලත් ඉල්ලුම්පත්‍ර වර්ෂ 1942ක්වූ මැයි මස 18වෙනි දින පෙරවරු 10 වනතුරු බාරගෙන තබාබලනවා ඇත. ඉල්ලුම්කාරයෝ ඉදිරිපිට සිටින්ට ඕනෑය. එසේ නැත්නම් නියම බලයලත් ඒජන්ත කෙනෙක් හෝ ඒජන්තවරු ලවා ඉල්ලුම්පත්‍ර හරි ඒවා බව ඔප්පුකරන්ට ඕනෑය.

3. යම් ඉල්ලුම්පත්‍රයක් භාරගැනීමේ හෝ නොගැනීමේ බලය ඒජන්තතුමා වෙත තබාගන්නාලදී.

4. ඒජන්තතුමා විසින් භාරගන්නාලද ඉල්ලුම්පත්‍ර අයිතිකාරයෝ ඉල්ලුම්පත්‍රවල සඳහන් මුදලෙන් ½ කොටසක් එවලේම ගෙවන්ට ඕනෑය. ඉතුරු මුදල් 1943වෙනි ජනවාරි මස පළමුවෙනිදට මත්තෙන් ගෙවන්ට ඕනෑය.

5. කැලෑවීම යන්වනොදී ඉඩම් හොඳ අත්දමින් තබාගැනීමට බදුකාරයා වගකිය යුතුය.

6. උවමනාකරණ කානු සහ වලවල් ආදිය කපා ඉඩමේ පස් සෝදායාම වැලැක්විය යුතුය.

7. බද්ද අවසානවූ විගාම හෝ අවලංගුකලවිට බදුකාරයා වගාවට අනතුරුනොකර ඉඩම් නිරවුල්ව භාරදිය යුතුයි.

8. කුපන්දීම සඳහා කාරනා රබර්පාලකතුමාගෙන් දැනගත යුතුයි.

9. රබර්පාලකතුමා විසින් නියමකලහොත් ඉඩම පරීක්ෂාකිරීමට සහ භක්ෂේරුකිරීමට යන මුදලක් බදුකාරයා විසින් ගෙවිය යුතුය.

10. වැඩිදුර කාරනා සබරගමු පලාතේ ඒජන්තතුමාගෙන් ලබාගත හැක.

මම 1942ක්වූ අප්‍රේල් මස 27වෙනි දින
රත්නපුරේ කච්චේරියේදීය.

ඩී. වනසුන්දර,
සබරගමු පලාතේ මහා ඒජන්තතුමා වෙනුවට.

| නො. | රෙජිස්ටර් නො. | ගම. | ඉඩම්වල විස්තර. | බිම්හරම, අ. රූ. ප. |
|---|---|---|---|---|
| | | | කුකුළුකෝරළය. | |
| 1 | 194S3R135 | ගෙදගල | ලොට් නො. 4I සහ 4J, F. V. P. 240 | 0 0 21 |
| 2 | 192S3R235 | ගවරගිරිය | ලොට් නො. 389A, V. P. 41 | 0 0 14 |
| 3 | — | එම | ලොට් නො. 575H, V. P. 41 | 1 3 24 |
| 4 | 192S3R236 | එම | ලොට් නො. 682Y (කොටසක්), V. P. 41 | 6 3 5 |
| 5 | 192S3R234 | එම | ලොට් නො. 531N, V. P. 41 | 2 2 6 |
| 6 | — | පරගල | ලොට් නො. 357B, F. V. P. 224 | 0 2 0 |
| 7 | 195S3R216 | මරතැල්ගොඩ | ලොට් නො. 84Q, V. P. 254 | 0 2 8 |
| 8 | 195S3R218 | එම | ලොට් නො. 153E, V. P. 254 | 0 2 0 |
| 9 | 197S3R93 | දෙල්ගොඩ | ලොට් නො. 27DB, F. V. P. 1 | 0 2 0 |
| | | | කුරුවිටිකෝරළය. | |
| 10 | 143S1R249 | කරදන | ලොට් නො. 679 (කොටසක්), F. V. P. 219 | 0 2 0 |
| 11 | 143S1R261 | කුඹුදෙණිය කහඩිකැලේ | ලොට් 114, F. V. P. 217 | 0 2 0 |
| 12 | 143S1R262 | එම | ලොට් නො. 152, F. V. P. 217 | 0 2 0 |
| 13 | — | ඉහලපොතෝරබාව | ලොට් 49, F. V. P. 315 | 0 1 20 |
| 14 | 145S1R354 | එපමවල | ලොට් නො. 220, F. V. P. 158 | 1 3 6 |
| | | | අටකලන්කෝරළය. | |
| 15 | — | කලල්ඇල්ල | ලොට් 76½ සහ 76¾, F. V. P. 10 | 4 2 0 |

PRINTED AT THE CEYLON GOVERNMENT PRESS, COLOMBO.